# G.C.E. AL



# උසස් පෙළ ගිණුම්කරණය (33 S )

# ACCOUNTING



**S P M Prabath Susantha**
B.Sc. Hons (Finance Special) USJP, Awarded CFA charter, USA, CME KSA
PGDE (Distinction – UOC), M. Ed (Management – UOC, reading for)
+94 71 103 2180 +94 74 083 2180
susanthaprabath@ gmail.com

# නිපුණතා (12 ශ්‍රේණිය)

| අංකය | නිපුණතාව | කාලච්ඡේද |
|---|---|---|
| 1 | ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව | 05 |
| 2 | ගිණුම්කරණ සමීකරණය | 15 |
| 3 | ද්විත්ව සටහන් ක්‍රමය | 12 |
| 4 | මූලික සටහන් පොත් | 93 |
| 5 | ගිණුම්කරණ සංකල්ප | 34 |
| 6 | කේවල ස්වාමී ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශන | 46 |
| 7 | නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන | 10 |
| 8 | අසම්පූර්ණ සටහන් | 14 |
| 9 | ලාභ අරමුණු කර නොගත් සංවිධාන | 16 |
| 10 | හවුල් ව්‍යාපාර | 55 |

# නිපුණතා 02 : ගිණුම්කරණ සමීකරණය



**<u>ඉගෙනුම් ඵල</u>**


- ව්‍යාපාර ඒකක සංකල්පය පැහැදිලි කරයි
- ව්‍යාපාරික සිදුවීම් විස්තර කරයි
- මූල්‍ය මිනුම් සංකල්පය පැහැදිලි කරයි
- ගිණුම්කරණ සමීකරණය ගොඩනගයි
- සමීකරණය මත ව්‍යාපාරික සිදුවීම්වල බලපෑම විස්තර කරයි

# විභාගයේ දී ගිණුම්කරණ සමීකරණය




1. ඒකක සංකල්පය හා මූල්‍ය මිණුම් සංකල්පය බහුවරණයක් ලෙස (පළමු ප්‍රශ්න පත්‍රය)
2. ව්‍යාපාරික සිදුවීම් නිසා ගිණුම්කරණ සමීකරණය මත වන බලපෑම බහුවරණයක් ලෙස (පළමු ප්‍රශ්න පත්‍රය)
3. ව්‍යාපාරික සිදුවීම් නිසා ගිණුම්කරණ සමීකරණය මත වන බලපෑම කෙටි පිළිතුරු ප්‍රශ්නයක් ලෙස (පළමු ප්‍රශ්න පත්‍රය)
4. ව්‍යාපාරික සිදුවීම් නිසා ගිණුම්කරණ සමීකරණය මත වන බලපෑම ව්‍යාහගත ප්‍රශ්නයක් ලෙස (දෙවන ප්‍රශ්න පත්‍රය)

# අයිතිකරුවා සහ ව්‍යාපාරය



සම්පත් සපයයි




අයිතිකරුවා (Owner)

ව්‍යාපාරය (Business)

ගිණුම්කරණයේ දි අයිතිකරුවා සහ ව්‍යාපාරය වෙනම ඒකක දෙකක් ලෙස සලකා කටයුතු කළ යුතු වේ. මෙය ගිණුම්කරණ ඒකක සංකල්පයයි. මෙය ව්‍යාපාර ඒකක සංකල්පය ලෙසද හඳුන්වයි

# ව්‍යාපාර ඒකක සංකල්පය අනුව



- ගිණුම්කරණය ව්‍යාපාරය සඳහා මිස අයිතිකරුවා සඳහා නොවේ.
- ගිණුම්කරණයේ දී සලකා බලනුයේ ව්‍යාපාරයට අයත් සිදුවීම් මිස අයිතිකරුවා සම්බන්ධ පුද්ගලික සිදුවීම් නොවේ.
- මූල්‍ය වාර්තා පිළියෙල කරනුයේ ව්‍යාපාරය සඳහා මිස අයිතිකරුවා සඳහා නොවේ.

# ක්‍රියාකාරකම් - 01

ව්‍යාපාර ඒකක සංකල්පයට අනුව පහත එක් එක් ප්‍රකාශයන් හා ඔබ එකඟ වන්නේ ද නැති ද යන්න එක් එක් ප්‍රකාශනය ඉදිරියෙන් ලියා දක්වන්න.

| ප්‍රකාශය | එකඟවේ/ නොවේ |
|---|---|
| I. ගිණුම් තැබීමේ දී ව්‍යාපාරයේ සිදුවීම් අයිතිකරුගේ පුද්ගලික සිදුවීම්වලින් වෙන් කොට හඳුනා ගත යුතු ය. | |
| II. අයිතිකරුවා විසින් ව්‍යාපාරයේ ආයෝජිත ප්‍රාග්ධනය ගිණුම් පොත්වල වෙනම හඳුනාගත යුතු ය. | |
| III. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දි ඒවා ව්‍යාපාරය නමින් පිළියෙල කළ යුතු ය. | |
| IV. අයිතිකරුවා හැර වෙනත් බාහිර පුද්ගලයින් ව්‍යාපාරයට ලබා දෙන සම්පත් වෙන ම වර්තා කළ යුතු ය. | |

# මූල්‍ය මිනුම් සංකල්පය



- ගිණුම්කරණයේ දී ව්‍යාපාරයට අදාළ සිදුවීම් පමණක් සලකාබලන අතර ඒවා මුදල් ඒකකයකින් මැන දැක්වීමට හැකිවිය යුතුය.
- මුදල් ඒකකයකින් මැන දැක්වීමට හැකි ව්‍යාපාරික සිදුවීම් පමණක් ගිණුම්කරණයේ දී සැලකිල්ලට ගැනීම මූල්‍ය මිණුම් සංකල්පය ලෙස අර්ථ දක්වයි.

# ක්‍රියාකාරකම් - 02

මූලාධ මිණුම් සංකල්පයට අනුව පහත එක් එක් සිදුවීම් ගිණුම්කරණ ක්‍රියාවලියේ යෙදවුම් ලෙස සැලකිය හැකිය නොහැකි ද යන්න ඒ ඒ සිදුවීම ඉදිරියෙන් ලියා දක්වන්න.

| සිදුවීම | හැකි බව/ නොහැකි බව |
|---|---|
| I. අයිතිකරුගේ අධ්‍යාපන සුදුසුකම්, දක්ෂතා සහ ව්‍යාපාරික පළපුරුද්ද ව්‍යාපාරක කටයුතු සඳහා ආයෝජනය. | |
| II. ව්‍යාපාර ගොඩනැගිල්ල සුන්දර පාරිසරයක පිහිටා තිබීම නිසා ගනුදෙනු කරුනවන් ව්‍යාපාරය වෙත ඇදී ඒම. | |
| III. අයිතිකරු ව්‍යාපාරය සඳහා තම පුද්ගලික මුදලින් මෝටර් රථයක් මිලට ගැනීම. | |
| IV. ව්‍යාපාරයට එරෙහිව ගනුදෙනුකරුවකු පවරා ඇති නඩුවක් සඳහා වන්දි ගෙවීමට සිදුවීම. | |

# මූලික ගිණුම්කරණ සමීකරණය



- අයිතිකරුවා සහ ව්‍යාපාරය පාර්ශවයන් දෙකක් බැවින් ව්‍යාපාරය ආරම්භ කිරීම වෙනුවෙන් අයිතිකරුවා ලබා දෙන සම්පත් (ප්‍රාග්ධනය) අයිතිකරුවාගේ හිමිකම යි.
- ඒ අනුව ආරම්භයේ දී අයිතිකරුවා ව්‍යාපාරයෙහි ආයෝජනය කරන සම්පත් (වත්කම්) සහ ව්‍යාපාරය සහ අයිතිකරු අතර බැඳීම (හිමිකම) එකිනෙකට සමාන වේ. මෙය මූලික ගිණුම්කරණ සමීකරණයයි

**වත්කම් = හිමිකම**

# ක්‍රියාකාරකම් - 03

2021.04.01 දින දිගාසිරි රු. 500 000 ක මුදල් ද තමන් සතු රු. 1 500 000 ක් වටිනා ඉඩම සහ ගොඩනැගිල්ල ද ආයෝජනය කරමින් ව්‍යාපාරයක් ඇරඹීය.

ඉහත ව්‍යාපාරික සිදුවීම මගින් මූලික ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම පහත ආකෘතිය භාවිත කරමින් ඉදිරිපත් කරන්න.

| දිනය | වත්කම් (රු. 000) | | = | හිමිකම (රු. 000) | |
|---|---|---|---|---|---|
| 2021.04.01 | ඉඩම් හා ගොඩනැගිලි | | | ප්‍රාග්ධනය | |
| | මුදල් | | | | |
| එකතුව | | | | | |

# ක්‍රියාකාරකම් - 04

2021.04.05 දින දිගාසිරි රු. 300 000ක අවුරුදු 5කින් ගෙවිය යුතු දිගු කාලින බැංකු ණයක් ව්‍යාපාර කටයුතු සඳහා ලබා ගත්තේ ය.

ඉහත ව්‍යාපාරික සිදුවීම මගින් මූලික ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම පහත ආකෘතිය භාවිත කරමින් ඉදිරිපත් කරන්න.

| දිනය | වත්කම් (රු. 000) | | = | හිමිකම (රු. 000) | | | වගකීම් (රු. 000) | |
|---|---|---|---|---|---|---|---|---|
| 2021.04.01 | | | | | | | | |
| 2021.04.05 | | | | | | | | |
| එකතුව | | | | | | | | |

# ක්‍රියාකාරකම් - 05

2021.04.10 දින විකිණීම සඳහා රු. 150 000 ක් විටිනා වෙළෙඳ තොයක් මුදල් ගෙවා ලබා ගත්තේ ය.

ඉහත ව්‍යාපාරික සිදුවීම මගින් මූලික ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම පහත ආකෘතිය භාවිත කරමින් ඉදිරිපත් කරන්න.

| දිනය | වත්කම් (රු. 000) | | = | හිමිකම (රු. 000) | | | වගකීම් (රු. 000) | |
|---|---|---|---|---|---|---|---|---|
| 2021.04.05 | | | | | | | | |
| 2021.04.10 | | | | | | | | |
| | | | | | | | | |
| එකතුව | | | | | | | | |

# ක්‍රියාකාරකම් - 06

2021.04.15 දින විකිණීම සඳහා ගත් රු. 150 000 ක් විටිනා වෙළෙඳ තොග රු. 200 000 ක අත්පිට මුදලට විකිණී ය.

ඉහත ව්‍යාපාරික සිදුවීම මගින් මූලික ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම පහත ආකෘතිය භාවිත කරමින් ඉදිරිපත් කරන්න.

| දිනය | වත්කම් (රු. 000) | | = | හිමිකම (රු. 000) | | | වගකීම් (රු. 000) | |
|---|---|---|---|---|---|---|---|---|
| 2021.04.10 | | | | | | | | |
| 2021.04.15 | | | | | | | | |
| | | | | | | | | |
| එකතුව | | | | | | | | |

# ක්‍රියාකාරකම් - 07

2021.04.20 දින දිගාසිරි තම පුද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරය සතු මුදල්වලින් රු. 50 000 ක් රැගෙන ගියේ ය.

ඉහත ව්‍යාපාරික සිදුවීම මගින් මූලික ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම පහත ආකෘතිය භාවිත කරමින් ඉදිරිපත් කරන්න.

| දිනය | වත්කම් (රු. 000) | | = | හිමිකම (රු. 000) | | | වගකීම් (රු. 000) | |
|---|---|---|---|---|---|---|---|---|
| 2021.04.15 | | | | | | | | |
| 2021.04.20 | | | | | | | | |
| එකතුව | | | | | | | | |

# ක්‍රියාකාරකම් - 08

පහතින් දක්වා ඇති ගිණුම්කරණ සමීකරණයෙන්ගේ අදාල හිස්තැනට ආ යුතු සංඛ්‍යාව ලියා දක්වන්න.

| | වත්කම් | | හිමිකම් | | වගකීම් |
|---|---|---|---|---|---|
| i. | රු. 250,000 | | රු............... | | රු. 125,000 |
| ii. | රු............... | | රු. 220,000 | | රු. 130,000 |
| iii. | රු. 350,000 | | රු 80,000 | | රු............... |
| iv. | රු. 420,000 | | රු............... | | නැත |

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper I

- **අංක 2, 3, 4 සහ 5 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

නුවන් විසින් 2020.01.01 දින ලිපිද්‍රව්‍ය අලෙවිසැලක් ආරම්භ කරන ලදී. ඔහුගේ සොහොයුරු සුජිත් මෙම ව්‍යාපාරයේ එකම සේවකයා වේ. පහත ගනුදෙනු 2020 ජනවාරි මාසය තුළ සිදු විය.

| අංකය | ගනුදෙනුව | වටිනාකම (රු.'000) |
|---|---|---|
| 1 | ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා නුවන් මුදල් යෙදවීම | 300 |
| 2 | ලිපිද්‍රව්‍ය අත්පිට මුදලට මිල දී ගැනීම | 200 |
| 3 | ලිපිද්‍රව්‍ය ණයට මිල දී ගැනීම | 550 |
| 4 | දෝෂ සහිත වූ බැවින් ණයට මිල දී ගත් ලිපිද්‍රව්‍ය වලින් කොටසක් ආපසු යැවීම | 50 |
| 5 | ලිපිද්‍රව්‍ය ණයට විකිණීම. මෙය තුළ රු. 64 000 ක එකතු කළ අගය මත බදු (VAT) අඩංගු ය | 864 |
| 6 | සුජිත්ට වැටුප් ගෙවීම | 40 |

මාසය තුළ විකුණු ලිපිද්‍රව්‍යවල පිරිවැය රු. 500 000 ක් විය. 2020.01.31 දිනට ව්‍යාපාරය විසින් ගෙවිය යුතු විදුලි වියදම රු. 30 000 ක් විය. ගැනුම් සහ අනෙකුත් වියදම් මත VAT නොමැති බව උපකල්පනය කරන්න.

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper I

## Answer- පිළිතුර

**3.** ගනුදෙනු අංක **1, 2, 3** සහ **4** හි **ශුද්ධ බලපෑම** නිරූපණය කරනු ලබන ගිණුම්කරණ සමීකරණය කුමක් ද?

| | වත්කම් (රු.'000) | = | වගකීම් (රු.'000) | + | හිමිකම් (රු.'000) |
|---|---|---|---|---|---|
| (1) | + 800 | | + 550 | | + 250 |
| ~~(2)~~ | ~~+ 800~~ | | + 500 | | + 300 |
| (3) | + 850 | | + 550 | | + 300 |
| (4) | + 1 000 | | + 700 | | + 300 |
| (5) | + 1 000 | | + 750 | | + 250 |

(……)

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper II

නාමල් ඔටෝ කෙයා තනි පුද්ගල ව්‍යාපාරයකි. මෙම ව්‍යාපාරය, පුද්ගලික සහ ආයතනික ගනුදෙනුකරුවන්ට වාහන නඩත්තු සේවා සපයනු ලබයි. 2020.01.01 දිනට මෙම ව්‍යාපාරයේ ආරම්භක ශේෂ පහත පරිදි විය.

| වත්කම් | රු.'000 |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 900 |
| තොගය (නඩත්තු අමුද්‍රව්‍ය) | 160 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 130 |
| ඉදිරියට ගෙවූ කුලිය | 240 |
| සේවකයන්ට ගෙවූ වැටුප් අත්තිකාරම් | 34 |
| බැංකුවේ ඇති මුදල් | 100 |

| වගකීම් හා හිමිකම | රු.'000 |
|---|---|
| දිගුකාලීන ණය | 400 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 90 |
| ගෙවිය යුතු විදුලිය | 12 |
| ආයතනික ගනුදෙනුකරුවෙකුගෙන් ලද අත්තිකාරම | 10 |
| හිමිකම | 1 052 |

මෙම ව්‍යාපාරයෙහි සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලැබේ.

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper II contd...

2020 ජනවාරි මාසය තුළ දී පහත ගනුදෙනු ව්‍යාපාරය තුළ සිදු කරන ලදී.

(i) වාහන සේදුම් යන්ත්‍රයක් රු. 360 000 කට ණයට මිල දී ගන්නා ලදී. 2022.01.01 දිනෙන් ආරම්භ වී වර්ෂ 03 ක කාලයක් තුළ මෙම ණය මුදල ගෙවිය යුතු වේ.

(ii) පිරිවැය රු. 130 000 ක් වූ නඩත්තු ද්‍රව්‍ය මිල දී ගන්නා ලද අතර, ඒ සඳහා රු. 60 000 ක මුදලක් ගෙවන ලදී. ඉතිරි මුදල මාස දෙකක් තුළ ගෙවිය යුතු වේ.

(iii) පුද්ගලික ගනුදෙනුකරුවන්ට රු. 140 000 ක නඩත්තු සේවා මුදලට සපයන ලදී. මේ සඳහා භාවිත කරන ලද නඩත්තු ද්‍රව්‍යවල පිරිවැය රු. 86 000 ක් විය.

(iv) රු. 12 000 ක් වූ අයිතිකරුගේ ජීවිත රක්ෂණ වාරිකය ව්‍යාපාරය විසින් ගෙවන ලදී.

(v) රු. 5 000 ක වට්ටමක් ලබා දීමෙන් පසු රු. 45 000 ක චෙක්පතක් ණයගැතියෙකුගෙන් ලැබුණි.

(vi) ආයතනික ගනුදෙනුකරුවෙකුට රු. 50 000 ක නඩත්තු සේවා සපයන ලදී. 2020.01.01 දිනට ආයතනික ගනුදෙනුකරුවෙකුගෙන් ලද අත්තිකාරම මෙම ගනුදෙනුවට අදාළ වන අතර, ඉතිරි මුදල වූ රු. 40 000 ක් සේවාව ලබාදීමෙන් පසුව ලැබුණි. පිරිවැය රු. 30 000 ක් වූ නඩත්තු ද්‍රව්‍ය මෙම සේවාව සඳහා භාවිත කරන ලදී.

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper II contd...

(vii) වැඩිහිටි නිවාසයක වාහනයක් සඳහා නඩත්තු සේවාවක් නොමිලේ සපයන ලදී. පිරිවැය රු. 6 000 ක් වූ නඩත්තු අමුද්‍රව්‍ය මේ සඳහා භාවිත කරන ලදී.

(viii) ව්‍යාපාරයේ මාසික ගිනි රක්ෂණ වාරිකය වූ රු. 4 000 ක් අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් ගෙවන ලදී.

(ix) දිගුකාලීන ණය රු. 400 000 සඳහා රු. 67 000 ක ණය වාරිකයක් ගෙවන ලදී. එය තුළ රු. 17 000 ක පොලියක් ඇතුළත් විය.

(x) ආයතනික ගනුදෙනුකරුවන්ට රු. 300 000 ක නඩත්තු සේවා ණයට සපයන ලදී. මෙම වටිනාකම මත 2% ක වෙළෙඳ වට්ටමක් ලබාදෙන ලදී. මෙම සේවා සැපයීම් සඳහා රු. 154 000 ක් පිරිවැය වූ නඩත්තු ද්‍රව්‍ය භාවිත කරන ලදී.

(xi) සේවකයන්ගේ මාසික වැටුප රු. 84 000 ක් වූ අතර, 2020.01.01 දිනට පැවති වැටුප් අත්තිකාරම් අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල ගෙවන ලදී.

(xii) 2020.01.01 දිනට ගෙවිය යුතු විදුලි බිල්පත ගෙවන ලදී. රු. 11 000 ක විදුලි බිල්පතක් ජනවාරි මාසය සඳහා ලද අතර එය මෙතෙක් ගෙවා නොමැත.

(xiii) පිරිවැය රු. 8 000 ක නඩත්තු ද්‍රව්‍ය හානි වූ අතර ඒවා රු. 3 000 ක අත්පිට මුදලට විකුණන ලදී.

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper II contd...

(xv) ව්‍යාපාර ස්ථානයේ මාසික කුලිය රු. 20 000 ක් වේ. 2020.01.01 දින කලින් ගෙවූ කුලිය තුළ දක්වා ඇත්තේ 2020 ලිත් වර්ෂය සඳහා ගෙවන ලද කුලී මුදලයි.

**අවශ්‍යවන්නේ:**

(1) 2020.01.01 දිනට ශේෂ සටහන් කර අංක (i) සිට (xv) දක්වා ඇති ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කරන්න. එක් එක් වටිනාකම ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (–) ද යන්න සඳහන් කරන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | |
| ආරම්භක ශේෂය | | | | | | | | | | |
| ගනුදෙනු: | | | | | | | | | | |
| (i) | | | | | | | | | | |
| (ii) | | | | | | | | | | |

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper II - පිළිතුර

(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ. පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | හිමිකම |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ. පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | හිමිකම |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper II - පිළිතුර

(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | හිමිකම |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | හිමිකම |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper II - පිළිතුර

(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ. පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ. පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper II - පිළිතුර

(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ. පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ. පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

# විභාගයේ දී - ගිණුම්කරණ සමීකරණ

## 2020 AL Paper II - පිළිතුර

(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |


(රු.'000)

| | වත්කම් | | | | | වගකීම් | | | | හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොගය | වෙළෙඳ ලැබිය යුතු දෑ | ඉදිරියට කළ ගෙවීම් සහ ගෙවූ අත්තිකාරම් | මුදල් | දිගු කාලීන ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ලද අත්තිකාරම් | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |




# -: END OF PRESENTATION :-